සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව

**10 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ | I පත්‍රය |
|---|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 පෘථිවි ශිලා ගෝලයට පෘථිවි කබොල හා ...................................................................... අයත් වේ. (සාගරික කබොල / ඉහළ ප්‍රාවරණය / පහළ ප්‍රාවරණය)

02 වායුගෝලයේ වැඩි වශයෙන් ම වායුව අන්තර්ගත වන වැදගත්ම කොටස .............................. km ක් දුරට භූතලයේ සිට ඉහළට විහිදේ. (90 / 100 / 120)

03 වායුගෝලයේ සංයුතියෙන් ..................................................... ප්‍රතිශතයක් ඔක්සිජන් හා ආගන් වායුව පවතී. (78.09 / 21.88 / 20.95)

04 පෘථිවි ජල චක්‍රය මගින් භූගත ජලය සකස් වන්නේ ......................................... හා වෑස්සීම මගිනි. (වර්ෂණය / කාන්දුවීම / මතුපිට ගලනය)

05 පෘථිවි ව්‍යුහය ආශ්‍රිත පාෂාණ ස්තරවල ඝන යකඩ පවතින්නේ ............................................... තුළ වේ. (පිටත හරය / ඇතුළත හරය / ප්‍රාවරණය)

06 ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය තුළ ................................................................................... දූපත් පිහිටා ඇත. (සුමාත්‍රා / ජාවා / පැපුවා නිව්ගිනියා)

07 ලෝකයේ උසම ස්ථානයක පිහිටි විලක් ලෙස .................................................. විල දැක්විය හැකිය. (වික්ටෝරියා / අයර් / ටිටිකාකා)

08 පැහැදිලි උණුසුම් ඍතුවක් දක්නට ලැබෙන දේශගුණික කලාපය වන්නේ ........................................ දේශගුණික කලාපයයි. (සෞම්‍යය / ශීත / නිවර්තන)

09 ලැටරයිට් පස හෝ කබොක් මිශ්‍ර රතු පස බහුලව යොදාගන්නේ ........................................ වගාවට වේ. (තේ / රබර් / පොල්)

10 ලෝකයේ වෙනත් වගාවන් සඳහා යොදා ගත නොහැකි ........................................ දේශගුණයක් පවතින ප්‍රදේශ කිරි පට්ටි පාලනයට යොදාගනී. (සෞම්‍ය / සිසිල් / උණුසුම්)

- **අංක 11 සිට 20 දක්වා වූ ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණද යොදන්න.**

11 ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදන අතිරික්තයක් පවතින පාරිසරික කලාපය අතරමැදි කලාපයයි. ( )

12 තේ වගාව වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාවේ අගලවත්ත තේ පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත. ( )

13 පොල් වගාවට ශ්‍රී ලංකාවේ බිමෙන් වෙන් වී ඇත්තේ 28% ක පමණ භූමි ප්‍රමාණයකි. ( )

14 ජාත්‍යන්තර වෙළඳපොළ රබර් වගාවට බලපාන සාධකයක් වේ. ( )

15 සුළු අපනයන බෝග පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ මාතලේ ය. ( )

16 මාතර පැඟිරි වගාව සඳහා ප්‍රසිද්ධ නොවේ. ( )

17 නව තෘණ වර්ග හඳුන්වාදීම සිදුකරන්නේ මීවන පාලන ප්‍රදේශයෙනි. ( )

18 ශ්‍රී ලංකාවේ මන්නාරම සිට හම්බන්තොට දක්වා වෙරළ තීරය බහුලව ධීවර කර්මාන්තය ව්‍යාප්ත වූ ප්‍රදේශයකි. ( )

19 AT 307 වැඩි ඵලදාවක් ලබාදෙන වී වර්ගයකි. ( )

20 මාෂ බෝග නිෂ්පාදනය සඳහා ඇතිකර තිබෙන පුහුණු මධ්‍යස්ථානය බටඅත පිහිටා ඇත. ( )

- **අංක 21 සිට 30 වූ දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

21 ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ...................................................................... අංශයෙන් 11.1% ක දායකත්වයක් පෙන්වයි.

22 කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි මිනිස් ශ්‍රමය මෙන්ම ................................................................ මගින් යොදාගන්නා ශ්‍රමය ද බලපාන සාධකයක් වේ.

23 කර්මාන්ත සඳහා යකඩ හා වානේවලට පැවති ඉල්ලුම ........................................................................ සොයාගැනීමත් සමග අඩුවුණි.

24 චීනයේ පිහිටි යකඩ හා වානේ කර්මාන්තය පිහිටි ස්ථානය ලෙස ........................................................................

ප්‍රදේශය දැක්විය හැකිය.

25 මෝටර් රථ කර්මාන්තය වර්තමානයේ දී ........................................................... කර්මාන්තයක් ලෙස වර්ධනය වී තිබීම විශේෂ ලක්ෂණයකි.

26 ප්‍රමාණයෙන් අති විශාල .................................................................. මගී නැව් නිෂ්පාදනය නැව් තැනීමේ කර්මාන්තයෙහි ප්‍රවණතාවයකි.

27 ලෝකයේ ............................................................ නිෂ්පාදන කර්මාන්තයෙන් 25% ක් දත්ත සැකසීමේ උපකරණ නිපදවයි.

28 ඩෙකෑන් හා පන්ජාබ් ප්‍රදේශ ඉන්දියාවේ ........................................................................ නිපදවන ප්‍රදේශ වේ.

29 පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා යොදාගන්නා කෙඔලින් ශ්‍රී ලංකාවේ ............................................ ප්‍රදේශයෙන් ලබාගනී.

30 ප්ලාස්ටික් හා කෘමිනාශක නිෂ්පාදනය ......................................................... කර්මාන්තයේ අතුරු නිෂ්පාදන වේ.

- **අංක 31 - 40 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

31 ශ්‍රී ලංකා ආර්ථිකයට විදේශ විනිමය උපයා දෙන කාර්මික භාණ්ඩ වලින් වැඩිම ආදායමක් උපයා දෙන භාණ්ඩ වර්ගය මින් කවරක් ද?

(1) රබර් නිෂ්පාදිත (2) ප්‍රවාහන උපකරණ

(3) රසායනික නිෂ්පාදන (4) රෙදිපිළි හා ඇඟලුම්

32 උඩරට තේ වගා කරන්නේ ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන කවර උන්නතාංශයකින් ඉහළ ප්‍රදේශය ද?

(1) 610 m (2) 1220 m (3) 300 m (4) 2300 m

33 මේවායින් නිවර්තන කලාපයේ පිහිටි රටක් නොවන්නේ මින් කවරක් ද?

(1) ඉන්දියාව (2) මැලේසියාවද

(3) ඇමෙරිකා එක්සත් ජනපදය (4) ෂයරය

34 ඕස්ට්‍රේලියාවේ මරේඩාලිං නිම්නය, මැඩගස්කරය, උතුරු ඇමෙරිකාවේ මිසිසිපි නිම්නය යන ප්‍රදේශ මින් කවර කරුණක් නිසා වැදගත් වේ ද?

(1) තේ වගා කරන ප්‍රදේශ වේ. (2) සාරවත් තැනි බිම් වේ.

(3) වී වගා කරන ප්‍රදේශ වේ. (4) කාර්මික ප්‍රදේශ වේ.

35 ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය අනුව දළ වශයෙන් ප්‍රමාණයන් පහත දැක්වේ.

A 42.9% B 26.1% C 31%

මෙම ප්‍රමාණ අනුව වඩාත් නිවැරදි පිළිතුර A B C පිළිවෙලින් දැක්වූ විට පිළිතුර කුමක් ද?

(1) කෘෂිකර්මය, කර්මාන්ත, සේවා (2) සේවා, කර්මාන්ත, කෘෂිකර්මය

(3) කර්මාන්ත, කෘෂිකර්මය, සේවා (4) සේවා, කෘෂිකර්මය, කර්මාන්ත

36 ශ්‍රී ලංකාවේ ගෘහ කර්මාන්ත සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) ප්‍රාග්ධන ආයෝජනය අධිකය. (2) පවුලේ ශ්‍රමය මත යැපේ.

(3) කුඩා අත් යන්ත්‍ර භාවිතා කරයි. (4) සම්ප්‍රදායික ශිල්ප ක්‍රම භාවිතය අධිකය.

37 මෙම ප්‍රදේශවලින් වී බිම් ඒකකයකින් වැඩිම අස්වනු ලබන දිස්ත්‍රික්ක අඩංගු පිළිතුර තෝරන්න.

(1) පොළොන්නරුව, ගම්පහ, කෑගල්ල (2) මහනුවර, මාතලේ, කුරුණෑගල


(3) ගාල්ල, කළුතර, මාතර (4) කුරුණෑගල, අනුරාධපුරය, අම්පාර

38 1 : 50000 මෙට්‍රික් සිතියම්වල කළු පැහැයෙන් දක්වන සංකේත අඩංගු වන්නේ මින් කවර පිළිතුරේ ද?

(1) රක්ෂිත වන භූමි මායිම, පාසල, ඇළ මාර්ග (2) අඩිපාර, ඇළ මාර්ග, අප්‍රධාන මාර්ග

(3) පාෂාණ උද්ගත, දුම්රිය මාර්ග, ජනාවාස (4) වී වගාව, අප්‍රධාන මාර්ග, අඩිපාර

39 1 : 50000 භූ ලක්ෂණ සිතියමක ආකෘතියක් දකුණු පසින් දැක්වේ. එහි A, B, C යන ස්ථානවල පවතින ලක්ෂණ පිළිවෙලින් අඩංගු වන පිළිතුර මේවායින් කුමක් ද?




(1) දිශාව, පරිමාණය, සිතියම් වර්ගය

(2) සිතියම් අංකය, පරිමාණය, ජනාවාස

(3) සූචකය, දිශාව, වනාන්තර

(4) දිශාව, පරිපාලන මායිම් දක්වන සටහන, මාර්ග

40 මෙම සිතියමේ මුහුණතෙහි x - y දක්වා සැබෑ දුර වන්නේ මින් කුමක් ද?

(ලකුණු 40 යි.)

(1) කිලෝමීටර් 40 (2) කිලෝමීටර් 25 (3) කිලෝමීටර් 20 (4) කිලෝමීටර් 80


## II - පත්‍රය

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II, III වශයෙන් කොටස් තුනකි. I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි අ, ආ, ඇ කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි. II කොටසින් ප්‍රශ්න දෙකකටත්, III කොටසින් ප්‍රශ්න දෙකකටත් වනසේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

### I කොටස

01 (අ) මෙට්‍රික් සිතියම් පිළිබඳව ඔබ ලබා ඇති දැනුම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ශ්‍රී ලංකාවේ 1 : 50000 මෙට්‍රික් සිතියම්වල කිසියම් ස්ථානයක පිහිටීම දක්වන ආකාර දෙක දක්වන්න. (ල. 02)




(2) 1 : 50000 සිතියමක දිශාව දක්වන ක්‍රම තුන මෙහි A, B, C ලෙස දකුණු පස දී ඇති රූපයේ දැක්වේ. ඒවා නම් කරන්න. (ල. 03)

(3) පහත සඳහන් තොරතුරු නිරූපණයට භාවිතා කරන සම්මත සංකේත යොදාගනිමින් 1 : 50000 පරිමාණයට අනුව නිරූපණය කරන්න.

(i) 3 km ක් දිග A ශ්‍රේණියේ මහා මාර්ගය (ii) 2 km ක් දිග වාරි මාර්ග ඇළ

(iii) 1 $km^2$ ක් විශාල ගෙවතු බිම (iv) 1½ km ක් දිග අඩි පාර

(v) 1 $km^2$ ක් වූ වැව (ල. 05)

(ආ) ඔබට සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් දෑ ලකුණුකොට නම් කරන්න.

(1) අප්‍රිකා මහාද්වීපයේ වී වගා කරන ප්‍රදේශයක්

(2) දකුණු ඇමෙරිකාවේ නිවර්තන දේශගුණයට අයිති රටක්

(3) ඉන්දියාවේ කපු වගාකරන ප්‍රදේශයක්

(4) චීනයේ පිහිටි යකඩ හා වානේ මධ්‍යස්ථානයක් පිහිටි ප්‍රදේශයක්

(5) ලෝකයේ විශාලතම විල (ල. 05)

(ඇ) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(1) කෘෂි තාක්ෂණික මධ්‍යස්ථානය පිහිටි ස්ථානය

(2) උතුරු ප්‍රදේශයේ පිහිටි බෝල මැටි නිධිය

(3) උඩරට තේ වගා කරන ප්‍රදේශය

(4) පොල් පර්යේෂණ මධ්‍යස්ථානය

(5) ඛණිජ තෙල් පිරිපහදු කර්මාන්ත ශාලාව පිහිටි ස්ථානය (ල. 05)

### II කොටස

02 සියලුම ජීව පද්ධතිවල පැවැත්ම සඳහා ජලය අත්‍යවශ්‍ය වේ. පානය කිරීමට හා අනෙකුත් ගෘහස්ථ කටයුතුවලට මෙන්ම කෘෂිකර්මය, කර්මාන්ත, ප්‍රවාහන වැනි කාර්යයන් සඳහා ද ජලය ප්‍රයෝජනයට ගනී.

(1) පෘථිවියේ ජලය ව්‍යාප්ත වී ඇති ආකාර 3 ක් දක්වන්න. (ල. 03)

(2) ජලයේ ගුණාත්මක බව අඩුවීමට හේතුවන මානව ක්‍රියාකාරකම් තුනක් දක්වන්න. (ල. 03)

(3) (a) ජල චක්‍රය ආශ්‍රිත ක්‍රියාවලි 2 ක් දක්වන්න. (ල. 02)

(b) වායු, ජල හා ශිලා ගෝලයන්හී ජල චක්‍රයේ ක්‍රියාවලිය සැකෙවින් විස්තර කරන්න. (ල. 02)

03 (1) ලෝකයේ භෞතික ලක්ෂණ කීපයක් පහත දක්වා ඇත. ඒවා අයත්වන මහාද්වීප හෝ රටවල් දක්වන්න.

1. තස්මේනියා දූපත
2. රොකී කඳු
3. ඩෙකෑන් සානුව
4. පාමීර් සානුව
5. වික්ටෝරියා විල
6. රයින් ගංගාව (ල. 06)

(2) (a) සාගර හා මුහුදු යන දෙවර්ගයේ ම කරදිය පවතින නමුත් මේවා එකිනෙකට වෙනස්වේ. සාගර හා මුහුදුවල වෙනස දක්වන්න. (ල. 02)

(b) ගංගාවක් යනු කුමක්දැයි දක්වන්න. ලෝකයේ ගංගා ආරම්භ වන ආකාර 2 ක් දක්වන්න.

(ල. 02)

04 මිනිස් ආර්ථික කටයුතු අතර නිෂ්පාදන කර්මාන්තවලට ඉතා වැදගත් තැනක් හිමිවේ.

(1) කර්මාන්තයක් ස්ථාන ගත වීමට බලපාන සාධක 4 ක් දක්වන්න. (ල. 02)

(2) ඉන්දියාවේ හා චීනයේ යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තය ස්ථාන ගතවීමට බලපා ඇති සාධක උදාහරණ දෙමින් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(3) යකඩ හා වානේ කර්මාන්තයේ නූතන ප්‍රවණතා 2 ක් දක්වන්න. (ල. 02)

(4) යකඩ හා වානේ කෙරෙහි දිනෙන් දිනම ඉල්ලුම වැඩිවීමට හේතු 2 ක් පහදන්න. (ල. 03)

05 ලෝකයේ වී වගා කරන රටවල් 4 ක් පහත සිතියමේ A, B, C, D ලෙස දක්වා ඇත.





(1) සිතියමේ A, B, C හා D ලෙස දක්වා ඇති රටවල් ආසියාවේ හා ඉන් පිටත වී වගා කරන රටවල් ලෙස වෙන්කර නම් කර දක්වන්න. (ල. 02)

(2) ආසියාවේ වී වගාව කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න. (ල. 03)

(3) ලෝකයේ වී වගාව ආශ්‍රිතව වර්තමානයේ කැපී පෙනෙන ලක්ෂණ 3 ක් දක්වන්න. ඉන් දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

## III කොටස

- අංක 06 හා 07 ප්‍රශ්නවලට පහත දී ඇති ශ්‍රී ලංකා සිතියම උපයෝගී කර ගන්න.




06 ශ්‍රී ලංකාවේ ජන ජීවිතය සමග බැඳුණු සුවිශේෂී ශාකයක් ලෙස පොල්ගස දැක්විය හැකිය.

(1) A, B, C ලෙස සිතියමේ දක්වා ඇති පොල් වගා කරන ප්‍රදේශ ස්ථානය ද සමග නම් කරන්න. (ල. 04)

(2) පොල් වගාව ව්‍යාප්ත වීම සඳහා බලපා ඇති සාධක තුනක් දක්වන්න. (ල. 03)

(3) පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන දක්වමින් ශ්‍රී ලංකාවේ පොල් වගාව ආශ්‍රිතව ඇතිවී තිබෙන නූතන ප්‍රවණතා 3 ක් දක්වන්න. (ල. 03)

07 (1) ඉහත සිතියමේ දැක්වෙන D, E හා F අක්ෂරවලින් දැක්වෙන ස්ථාන නම් කර ඒවායේ ධීවර කර්මාන්තය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් දක්වන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය කෙරෙහි හිතකර සාධක තුනක් දක්වන්න. (ල. 03)

(3) ශ්‍රී ලංකා ආර්ථිකයට ධීවර කර්මාන්තය නගාසිටුවීමේ වාසි තුනක් පහදන්න. (ල. 04)

08 (1) ශ්‍රී ලංකාවේ පවතින පහත සඳහන් කාර්මික අමුද්‍රව්‍ය පවතින ස්ථාන එක බැගින් දක්වන්න.

1. ධමනි මිනිරන් 2. මයිකා

3. කෙඔලින් 4. බෝල මැටි (ල. 04)

(2) ඉහත දැක්වූ එක් අමුද්‍රව්‍යයක් ආශ්‍රිතව කෙරෙන කර්මාන්ත ආශ්‍රිත ප්‍රවණතා තුනක් දක්වන්න. (ල. 03)

(3) ශ්‍රී ලංකාවේ විද්‍යුත් උපකරණ නිෂ්පාදන කර්මාන්තය මෑතකදී ශීඝ්‍රයෙන් දියුණු වන කර්මාන්තයකි. ඊට හේතු දක්වමින් විද්‍යුත් උපකරණ නිෂ්පාදනය ආශ්‍රිත ප්‍රවණතා 3 ක් පැහැදිලි කරන්න. (ල. 03)

09 ශ්‍රී ලංකාව අතීතයේ සිටම ආකර්ෂණීය රටක් ලෙස ලොව පුරාම ප්‍රසිද්ධ වී ඇති අතර, ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සංචාරක කර්මාන්තයට වැදගත් තැනක් හිමිවී තිබේ.

(1) පහත සඳහන් සංචාරක කලාපවල ප්‍රධාන නගර දෙක බැගින් නම් කරන්න. (ල. 03)

(මහ කොළඹ කලාපය / නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශ / දකුණු වෙරළබඩ ප්‍රදේශය)


(2) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ගැටළු තුනක් දක්වන්න. (ල. 03)

01 (ආ) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම




The National e-Learning Portal for The General Education

01  (ඇ)  ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම




ඉ-තක්සලාව
The National e-learning Portal for The General Education